ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

# ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සහ ආර්ථික සබඳතාහි නව පරිච්ඡේදයක් සනිටුහන් කරමින් නාගපට්ටිනම් සහ කන්කසන්තුරය අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවාව ඇරඹේ

ඉන්දියාවේ නාගපට්ටිනම් සහ ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ යාපනය ආසන්නයේ පිහිටි කන්කසන්තුරය අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවාව 2023 ඔක්තෝබර් 14 වන දින ආරම්භ කෙරිණි. මෙම බෝට්ටු සේවාව නාගපට්ටිනම් හිදී ඉන්දියාවේ වරාය, නාවික කටයුතු සහ ජල මාර්ග අමාත්‍ය ශ්‍රී සර්බානන්ද සොනොවාල් මැතිතුමා විසින් වරායේ සිට ද විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා විසින් අන්තර්ජාලය ඔස්සේ ද සමාරම්භ කරන ලදී. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදී මැතිතුමා සහ ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා වීඩියෝ තාක්ෂණය ඔස්සේ මෙම අවස්ථාව ඇමතූහ. ශ්‍රී ලංකාවේ වරාය, නාවික කටයුතු සහ ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා ද අන්තර්ජාලය ඔස්සේ මෙම අවස්ථාවට සහභාගී විය.

2. මෙම අවස්ථාව අමතමින් අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදී මැතිතුමා ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් 2023 ජූලි මාසයේ සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුරදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික හවුල්කාරීත්වය සඳහා ඒකාබද්ධව සම්මත කරගත් දැක්ම ප්‍රකාශය සිහිපත් කළේය. මෙම දැක්මේ කේන්ද්‍රීය තේමාව වන්නේ සම්බන්ධකතාවයයි. සම්බන්ධකතාවය දෙරට සහ දෙරටෙහි ජනතාව වඩා සමීප කරන බව එතුමා ප්‍රකාශ කළේය. 2023 සැප්තැම්බර් මස ඉන්දියාවේදී පැවති G20 සමුළුව අතරතුර ප්‍රකාශයට පත් කරන ලද ඉන්දියා-මැද පෙරදිග - යුරෝපා ආර්ථික කොරිඩෝව සිහිපත් කළ අග්‍රාමාත්‍යතුමා මෙම සම්බන්ධකතා කොරිඩෝව මගින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බහුවිධ සම්බන්ධකතාවය සවිමත් වන බව සහ එමගින් ශ්‍රී ලාංකික

ජනතාවට සෙත සැලසෙන බව සඳහන් කළේය.UPI සහ ලංකාපේ (Lanka Pay) සේවාවන් සම්බන්ධ කරමින් මූල්‍ය තාක්ෂණ සේවා සම්බන්ධකතාවය ඉහළ නැංවීමට ද බලශක්ති සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා බලශක්ති ජාලයන් සම්බන්ධ කිරීමට ද දෙරටෙහිම රජයන් කටයුතු කරමින් සිටින බව ද එතුමා ප්‍රකාශ කළේය. රාමේෂ්වරම් - තලෙයිමන්නාරම අතර සාම්ප්‍රදායික මාර්ගය විවෘත කරමින් එම ස්ථාන දෙක අතර බෝට්ටු සේවා ඇරඹීමට ද ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ රජයන් කටයුතු කරන බව එතුමා සඳහන් කළේය.

3. මෙම අවස්ථාව අමතමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා දෙරට ජනතාව අතර බැඳීම් ශක්තිමත් කිරීමට බෝට්ටු සේවාව විසින් ඉටු කරන වැදගත් භූමිකාව අවධාරණය කළ අතර එතුමා මෙම සේවාව ආරම්භ කිරීමට පියවර ගැනීම සම්බන්ධයෙන් ඉන්දීය රජයට සහ ඉන්දියාවේ නාවික සංස්ථාවට සිය ස්තුතිය පළ කළේය.

4. එමෙන්ම මෙම අවස්ථාව අමතමින් විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා සඳහන් කළේ බෝට්ටු සේවාව ආරම්භ කිරීම ඉන්දීය රජයේ ජනතා කේන්ද්‍රීය ප්‍රතිපත්තීන් යළි තහවුරු කරන බවයි. ඉන්දීය රජයේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තියේ මූලික අවධානය යොමු වන්නේ සම්බන්ධකතාවයට, සහයෝගීතාවයට සහ සබඳතාවන්ට වන අතර අනාගතයේ දී විදුලිබල ජාල සම්බන්ධතාවය, තෙල් නලය සහ ආර්ථික කොරිඩෝවක් ස්ථාපිත කිරීම වැනි දේ හරහා ශ්‍රී ලංකාව සමඟ සම්බන්ධකතාවය තවදුරටත් ඉහළ නැංවෙනු ඇත. ගුවන් සහ සාගර සම්බන්ධකතාවය ස්ථාපිත කිරීම, සුමට වීසා ක්‍රියාවලිය සහ සංචාරක සබඳතා ශක්තිමත් කිරීම සාමාන්‍ය මහජනතාවගේ ජීවිත වඩා පහසු කරනු ඇතැයි ජයිශංකර් මහතා පැවසීය.

5. ඉන්දියාවේ වරාය, නාවික සහ ජලමාර්ග අමාත්‍ය ශ්‍රී සරබානන්ද සොනෝවාල් මැතිතුමා මෙම බෝට්ටු සේවාව ආරම්භ කිරීම ඓතිහාසික පියවරක් බව සඳහන් කළ අතර එය දෙරටෙහි ජනතාවට කාර්යක්ෂම සහ අඩු පිරිවැය ප්‍රවාහන ක්‍රමයක් වනු ඇති බව සඳහන් කළේය. මේ අතර මෙම අවස්ථාව අමතමින් ශ්‍රී ලංකාවේ වරාය, නාවික කටයුතු සහ ගුවන් සේවා අමාත්‍යතුමා ශ්‍රී ලංකාවේ උතුරු පළාතට ප්‍රතිලාභ රැසක් ගෙනදෙන කන්කසන්තුරය වරාය නවීකරණය කිරීම සඳහා ලබාදුන් සහයෝගය සම්බන්ධයෙන් ඉන්දියාවට ස්තුතිය පළ කළේය.

6. ඉන්දියාවේ නාවික සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම අධිවේගී බෝට්ටු සේවාව මගින් වරකට පුද්ගලයන් 150 දෙනෙකුට ගමන් කළ හැකිය. නාගපට්ටිනම් සහ කන්කසන්තුරය අතර ප්‍රථම ගමන (නාවික සැතපුම් 60ක් පමණ) සඳහා පැය හතරක් පමණ ගත විය. මෙම ප්‍රථම බෝට්ටුවෙන් කන්කසන්තුරයට පැමිණි පිරිස ශ්‍රී ලංකාවේ වරාය, නාවික කටයුතු සහ ගුවන්සේවා අමාත්‍යතුමා සහ යාපනයේ ඉන්දීය කොන්සියුලර් ජෙනරාල්තුමාවිසින් පිළිගන්නාලද අතර එම දෙපළ විසින් කන්කසන්තුරය සිට නාගපට්ටිනම් දක්වා යන පිරිසට ද සිය සුබපැතුම් ද එක් කරන ලදී.

***

කොළඹ
2023 ඔක්තෝබර් 16